# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,125 — 1960 මැයි 6 වැනි සිකුරාද — 6.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 89 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන — — | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මංගී කොම්පි දන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම් ... ... ... | — | විවිධ දන්වීම් — — | 89 |


## පළාත් පාලන නිවේදන

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කාර්‍ය සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනත**

1951කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 13 ඒ 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරිතැනවූද කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම් කාර්ය සභාවේ සභාපතිතැනවූද ඒ. පී. සෝමරත්න වන මම, 1960 වර්ෂයේදී මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කාර්‍ය සභාවට අයත් ගම් ප්‍රදේශය ඇතුලත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමී.

**උපලේඛනය**

මැයි 3, 10, 11, 17, 24.
ජූනි 2, 8, 15, 23.
ජූලි 1, 8, 15, 22, 31.
අගෝස්තු 6, 13, 21, 29.
සැප්තැම්බර් 4, 12, 20, 27.
ඔක්තෝබර් 4, 12, 19, 27.
නොවැම්බර් 2, 11, 18, 25.
දෙසැම්බර් 2, 11, 17, 24.

ඒ. පී. සෝමරත්න,
හොරොම්බාව ගම්කාර්ය සභාපති තැන.

වර්ෂ 1960ක්වූ අප්‍රේල් මස 26 වැනි දින,
හොරොම්බාව ගම්කාර්ය සභා කාර්යාලය,
ගොඩවෙල, කටුපොත.

---

## විවිධ දන්වීම්

### හලාවත දිස්ත්‍රික්කයේ—යටකලන් පත්තු ගම්කාර්ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උප ලේඛණයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම්කාර්ය සභා සීමා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දිනසිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතේ සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දනුම් දෙමි.

**උපලේඛණය**

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය |
|---|---|
| මාදම්පිටි හෙට්ටිආරච්චිගේ ලදිස්ලාවුස් අප්පුහාමි | පහළ හත්තිනිය, කහටගහ වත්ත |

ඒ. වික්‍රම ආරච්චි,
වැඩ බලන ගම්කාර්ය සභාපති,

ගම්කාර්ය සභා කාර්යාලය,
හත්තිනිය — මාරාවිල.
1960 අප්‍රියෙල් 26


89—ජේ. ඇන්. බී 23670—3,299 (4/60)

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. ඇම්. ජයතිලක,
පන්නල ගම්කාර්ය සභාපති.

පන්නල ගම්සභා කාර්යාලය,
යක්විල, 29.4.60

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
| --- | --- | --- |
| ඒ. ආබ්දීන්, බම්මන්න, නාරන්ගොඩ | බම්මන්න | හරක් මස් සහ එළුමස් |

---

## අලව්ව් ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1960 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මාවෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත අඥා පනතේ 6 වෙනි වගන්තියෙන් සංශොධනය කරනලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන අලව්ව ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මාවෙත එවියයුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම කරන ස්ථානය | වෙළඳාම |
| --- | --- | --- |
| (1) ඒ.ඩී. චාර්ලිස්,මාර්කට්, කඳන. | අහහරුවාද පොල,අලව්ව | ඌරු මස් |
| | සිකුරාද පොල,අලව්ව | ඌරු මස් |
| (2) ඒ.එච්. ඩාර්ලිස් සිල්වා, අලව්ව | අලව්ව කඩමණ්ඩිය | ඌරු මස් |

යූ. බී. අලව්ව,
අලව්ව ගම්කාර්ය සභාවේ ප්‍රධානතැන.

ගම්සභා කාර්යාලය,
අලව්ව, 26.4.60.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායෲංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කායෲංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.